# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1859/34 - 2014 අප්‍රේල් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2014.04.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ කුරුණෑගල මහ නගර සභාවේ සභික ධූරයේ පුරප්පාඩුව පිරවීම**

අවසර නොලබා සභාවේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණ නොසිටීම හේතු කොට ගෙන කුරුණෑගල මහ නගර සභාවේ සභික ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

අබ්දුල් සත්තාර් නම් වූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලෙක්ම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ කුරුණෑගල මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන අබ්දුල් සත්තාර් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කුරුණෑගල මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරි තලංගම අප්පුහාමිලාගේ චමින්ද නාමල් තලංගම වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, අබ්දුල් සත්තාර් මහතා කුරුණෑගල මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ඒ. සී. එන්. තලංගම,
තේරීම්භාර නිලධාරි,
කුරුණෑගල මහ නගර සභාව.

2014 අප්‍රේල් මස 07 වන දින,
මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

05 - 246


1A - G 19441— 75 (2014/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*